# පොල් වගාවට ආධාරකයක්: ග්ලිරිසීඩියා

පොල් වගාවෙන් ලබා ගත හැකි ලාභය ඉතා සීමිතය. රසායනික පොහොර මිල වැඩි වීම නිසා එම ලාභය තවත් අඩුවන අතර එමගින් ගොවීන් විසින් පොහොර භාවිතය අතහැර දැමීමට ද ඉඩ ඇත. මෙම තත්ත්වයට පිළියම් නිසිකල යෙදිය යුතු අතර ඒ සඳහා පසෙහි සාරවත් බව වර්ධනය කෙරෙන මිල අඩු වඩා සාර්ථක විකල්ප පෝෂණ මාර්ගයන් සෙවිය යුතුවේ.

වාසනාවකට මෙන්, අනාගතය දෙසා බලා පොල් පර්යේෂණ ආයතන 1984 දී පස් අවුරුදු පර්යේෂණ වැඩ සටහනක් ආරම්භ කළේය. එහි එක් අරමුණක් වූයේ කෘත්‍රිම පොහොර වෙනුවට කාබණික පොහොර වර්ග ආදේශ කිරීමේ හැකියාවන් සොයා බැලීමය.

එම පර්යේෂණ ප්‍රතිඵල වලින් පැහැදිලි වන එක් කරුනක් නම් පොල් විගාවේ නයිට්‍රජන් අවශ්‍යතා සියල්ලද, පොස්පේට්, පොටෑසියම් හා මැග්නීසියම් අවශ්‍යතාවලින් සැලකිය යුතු කොටසක් ද කොල පොහොර හා සත්ත්ව පොහොර මගින් ලබා ගත හැකි බවයි.

පස ආවරණය කෙරෙන වැල් වර්ග, ග්ලිරිසිඩියා වැනි රණිල පඳුරු වැවීම හා සත්ත්ව පාලන කටයුතු මේ සඳහා නිර්දේශ කෙරිණි. ආවරණ වගා කිරීම හා සත්ත්ව පාලන කටයුතු වලට අවශ්‍ය අරමුදල් හා ශ්‍රම ප්‍රමාණය සාමාන්‍ය ගොවියෙකුට ලබා ගත නො හැකි පමණ ඉහළ මට්ටමක පවතින නිසා මෙබඳු වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ හැක්කේ විශාල වතු හිමියන්ට පමණි.

වගා කිරීම පහසු, නඩත්තුව සඳහා මුදලක් වැය නො වන ග්ලිරිසිඩියා කුඩා පොල් ඉඩම් වලට අවශ්‍ය පෝෂණය ලබා දීමේ ඉතා සුදුසුම ගස් වර්ගය වෙයි. එය ඉතා ඉකමණින් තෙත් කලාපයේ මෙන්ම වියලි කලාපයේත් වැවෙන ශාකයකි. එමෙන් එය වැට සඳහා උපයෝගී කර ගන්නා ගස් වර්ගයක් ද වෙයි. එලෙසම වසරක් තුළ දී දෙතුන් වතාවක් එය කප් පාදු කළ හැකි ද වේ.

ග්ලිරිසිඩියා ගස් සියයක් වසරක් තුළ දී දෙවරක් කප්පාදු කළ හොත්, කිලෝ ග්‍රෑම් 500 ක කොළ පොහොර ලැබේ. ගස් මෝරණ විට ප්‍රමාණය තවත් වැඩි වේ. මෙමගින් ලැබෙන පෝෂණය යූරියා කිලෝ 13කින් ද, පොස්පේට් කිලෝ 4 කින් ද, පොටෑසියම් කිලෝ 6 කින් හා ඩොලමයිට් කිලෝ 5 කින් ද ලැබෙන පෝෂණ ප්‍රමාණයකට සමානය.

පෝෂණ පදාර්ථ සැපයීමට අමතරව, ග්ලිරිසිඩියා කොළ පොහොර පසට එක් කිරීමෙන් පසෙහි ව්‍යුහයාත්මක තත්ත්වයන් හා තෙතමනය වර්ධනය වේ. මෙය වියලි හා අතුරුමැදි කලාපවල පොල් වගාවට ලැබෙන අතිරේක වාසියකි. ග්ලිරිසිඩියා කොළ යෙදීම නිසා සමහර කෘමීන් පලායන බව ද වාර්තා වේ.

පොල් පර්යේෂණායතනයේ
හිටපු සභාපති
**ආචාර්ය ඩී. වී. ලියනගේ
විසිනි**

පොල් ගසට වසරක දී ග්ලිරිසිඩියා කොල පොහොර කිලෝ 30 ක් දැමීමෙන් පසට අවශ්‍ය මුළු නයිට්‍රජන් ප්‍රමාණය ද, පොස්පේට් සහ පොටෑසියම් අවශ්‍යතා වලින් සියයට 15—20ක් ද මැග්නීසියම් අවශ්‍යතා වලින් සුළු කොටසක් ද ලැබේ. ගසකට වසරක දී රසායනික පොහොර කිලෝ ග්‍රෑ 2 ක බැගින් යෙද වෙ දී හෙක්ටරයකට රුපියල් 2,2000 ක් වැය වේ. කිලෝ 30 ක ග්ලිරිසිඩියා දැමීමෙන් හෙක්ටර් යාරයකට රුපියල් 800 ක එනම් මුළු වැයෙන් 36% ක ඉතිරියෙන් ඉඩම් හිමියාට අත්කර ගත හැකිය.

වැඩුන ගස් වල අතු වලින් මෙම ගස් පැල කර ගත හැකිය. මෙම පැලෑටියේ වගාව වර්ධනයකිරීමට මෙලෙස අතුලබා ගැනීම දුෂ්කර විය හැකිය. ඇට වලින් පැල ලබා ගැනීම පහසුය. ලාභදායකය. කප්පාදු නො කරන ලද ගස්වල ජනවාරි —මාර්තු කාලයේ දී විශාල මල් හට ගන්නා නමුදු එමගින් ඇට ලබා ගැනීමට මෙරෙන්නේ සුළු ප්‍රමාණයකි. අප්‍රේල් මාසයේ දී ලබා ගත හැකි එක් කිලෝ ග්‍රෑමයක ඇට 5000 ක් 10,000 ත් අතර ප්‍රමාණයක් ඇත.

එම ඇට වර්ග සෘජුවම පාත්තිවල හෝ පොලිතීන් බෑග් වල පැළ කළ හැකිය. එම පැල මාස දෙකක් වයස් වූ විට සිටුවීමට සුදුසුවන අතර ඉඩමේ මායිමේ සෙ. මී. 60 ක් පරතරයක් ඇතිව ඒවා සිටුවීම සුදුසුය. හෙක්ටයාරයක මායිමේ දුර ප්‍රමාණය මීටර් 400 ක් සේ සැළකූ විට (පැල නොවන සංඛ්‍යාව අඩු කළ විට) පැල 900 ක් වගා කළ හැකි වෙ.

මෙම පැල වලින් හෙක්ටයාරයට අවශ්‍ය කොළ පොහොර ප්‍රමාණය නිපදවා ගත හැකිය. විශාල වතු වල මායිමට අමතරව පොල් පේළි අතරේ ද ග්ලිරිසිඩියා වගා කළ හැක. මේ සඳහා නව ක්‍රමයක් ඇති කළ යුතු වේ.

තෙත් කලාපයේ පොල් ඉඩම්වල අතුරු භෝගයක් ලෙස ගම්මිරිස් වගා කරන බව අපි දනිමු. එම වගාව මනා ලෙස කළ හොත් එමගින් පොල් පලදාවත්, ඉඩමෙ නිෂ්පාදන හැකියාවනුත්, වැඩි වේ. මෙ අනුව ඉඩම් හෙක්ටයාරයක ගම්මිරිස් පැල 1000ක් වගා කළ හැකිය. එහි තේරුම නම් එම ප්‍රමාණයට ග්ලිරිසිඩියා ගස් ද, ගම්මිරිස්වල ආධාරකයක් ලෙස වැවිය හැකි බවයි. ගම්මිරිස් වල වදුල නැති කිරීම සඳහා ග්ලිරිසිඩියා ගස් නිති පතා කප්පාදු කළ යුතු අතර එමගින් ලැබෙන කොළ, පොහොර ලෙස භාවිතා කළ හැකිය.

ඉහත සඳහන් කළ ලෙස ක්‍රමානුකූලව කෙරෙන පොල් හා ගම්මිරිස් ඒකාබද්ධ වගා වෙන් පොල් නිෂ්පාදනය, ඉඩමේ පලදායිතාවය වැඩි කර රසායනික , පොහොර භාවිතය අඩු කිරීම තුළින් නිෂ්පාදන පිරිවැය ද අඩුකර ගත හැකිය, එයට අමතරව රැකියා අවස්ථාවන් ද වර්ධනය වෙ. මෙම ක්‍රමය කුඩා ඉඩම් හිමියන්ට පමණක් නොව වතුවලට ද ඉතා සුදුසු ක්‍රමයක් වෙයි. එලෙසින් ම එය පොල් ඉඩම් වල ආදායම් වැඩි කිරීමට ජනසවියට ද ආධාර වන වැඩ පිළිවෙළකි.

(මෙම ලිපියේ යොදා ගත් සංඛ්‍යා ලේඛණ පොල් සංවර්ධන අධිකාරියේ හා පොල් පර්යේෂණ ආයතනයේ. ප්‍රකාශන වලින් උපුටා ගන්නා ලදී.)